# කැලණිය විශ්වවිද්‍යාලය හා භාරතීය ශාස්ත්‍රීය සම්ප්‍රදාය

## මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු

විද්‍යාලංකාර පිරිවෙන භාරතීය විද්වත් සම්ප්‍රදාය හා සමඟ ඇති කොට ගත් සම්බන්ධතාව ඇරඹෙන්නේ ව්‍යවහාර වර්ෂ 1878 දී පමණ සිට ය. එය භාරතයේ ප්‍රකට වූයේ සංස්කෘත හා පාලි භාෂා මෙන් ම ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය පිළිබඳ කේන්ද්‍රීය උසස් අධ්‍යයන ආයතනයක් ලෙසට ය. එවක විද්‍යාලංකාර පිරිවෙනේ අධිපතිව වැඩ විසූ ශ්‍රී ධර්මාලෝක මහාස්ථවිර පාදයන් වඩාත් ප්‍රකට වූයේ, කුමාරදාස කවීන්ද්‍ර නරේන්ද්‍රයින්ගේ ජානකීහරණ මහා කාව්‍යය ශ්ලෝක නොමැතිව සිංහල පදාර්ථයන්ගෙන් පමණක් යුක්තව තිබෙනු දැක, ඒ සන්නය සහාය කොට ගෙන යළිත් එම මහා කාව්‍යය නිර්මාණය කොට 1890 දී ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ය. එසේ ද වුවත් බෞද්ධ විද්‍යාපීඨයක් හා ප්‍රාචීන ශාස්ත්‍ර ශාලාවක් වශයෙන් විද්‍යාලංකාර පිරිවෙන්හි කීර්තිය පෙරපර දෙදිග රටවල වඩාත් පැතිර ගියේ ශ්‍රී ධර්මානන්ද යුගයේ දී (1918 - 45) ය.

විද්‍යාලංකාර පිරිවෙනට විශ්වවිද්‍යාල තත්ත්වය ප්‍රදානය කිරීම උදෙසා පැවැති ආරම්භක රැස්වීමක දී එකල ආහාර හා කෘෂිකර්ම ඇමති ධුරය දැරූ ගරු පිලිප් ගුණවර්ධන මහතා අධ්‍යාපනික හා ශාස්ත්‍රීය වශයෙන් එම ආයතනය ලබා තිබූ විශිෂ්ටත්වය පැහැදිලි කළේ මෙසේ ය. '.... අවුරුදු ගාණක් තිබුණ පිරිවෙනට ආණ්ඩුව විසින් දෙන්ට වුවමනා නැ මේ තත්ත්වය. මෙතෙක් තිබුණේ විශ්ව විද්‍යාල තත්ත්වයක්. තත්වය අරගෙන අවසානයි. ඇත්තේ කටයුතු කරන්ට පිළියෙල කර අවසන් නීතිගත කිරීම පමණයි කියා මම ප්‍රකාශ කරන්නට කැමැතියි (මෙහෙන ආණ්ඩුව සහ පිරිවෙන්